www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ පොරොව වදිනු ඇත්තේ කොතැනට ද

## Where Obama’s axe will fall

**2011 ජුලි 15**

ෆෙඩරල් රජයේ නය සීමාව නැංවීම මත කොංග්‍රසයේ රිපබ්ලිකානුවන් හා ඔබාමා පරිපාලනය අතර වර්තමානයේ පැනනැගී ඇති ආරවුල අවසන් කිරීම සඳහා රිපබ්ලිකානු සෙනෙට් සභිකයෙකු හා සුලුතරයේ නායකයා ද වන මිට්ච් මැකොනෙල් පරිපාටිමය යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් පසුව 13 දා ධවල මන්දිරය එයට දැක්වූ ප්‍රතික්‍රියාව කැපීපෙනෙයි. සිදුනොවන අපේක්ෂාවක් වුවත් කොංග්‍රසය ජනාධිපතිගේ නිෂේධ බලය යටපත් කලොත් මිස මෙම යෝජනාව වියදම් කප්පාදු කිරීමේ පනතකින් තොරව නය සීමාව ඉහල දැමීමට ඔබාමාට අවසරය ලබා දෙනු ඇත.

සමාජ සුබසාධන වැඩ සටහන් මත වැඩි පීඩනයක් යෙදීමට නය සීමා කාලාන්තය පාවිච්චි කිරීමේ තම වර්තමාන උත්සාහය අතහැර දැමීමක් වන නිසා නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ රිපබ්ලිකානුවෝ යෝජනාවට විරුද්ධ වූහ. අයවැය හිඟය අඩුකිරීමේ අර්ථවත් සමබර එකඟත්වයකට පැමිනීමේ විශිෂ්ට අවස්ථාව අල්ලා ගැනීමට පරිපාලනය තවමත් සූදානම් බව ප්‍රකාශ කරමින් ඔබාමාගේ ප්‍රවෘත්ති ලේකම් කාර්නේ මෙම ආස්ථානය ඉඳුරාම පිලි ගත්තේ ය.

*නිව් යෝර්ක් ටයිම්ස්* පුවත් පතේ සිට නේෂන් සඟරාව දක්වා වන ඔබාමාගේ ලිබරල් දේශපාලන ක්ෂමාලාපකයෝ රිපබ්ලිකානු අයවැය කප්පාදුකරුවන්ගෙන් සමාජ වැඩසටහන් ආරක්ෂා කිරීමට ඔබාමා යෝධ අරගලයක යෙදී සිටී යයි සිතුවම් කරන අතර ඔබාමාගේ ම ප්‍රකාශකයෝ දැවන්ත සමාජ වියදම් කප්පාදුව සඳහා වන ඔහුගේ කැපවීම පුනරුච්චාරනය කරති.

උප ජනාධිපති බිඩෙන්ගේ සභාපතිත්වයෙන් මෙහෙයවූ පසුගිය මාසයේ පැවති ද්විපාක්ෂික සාකච්ඡා ඇදහිය නොහැකි පරිමාවක සමාජ සේවා කප්පාදු දැනටමත් හඳුනාගෙන ඇත. මෙම කප්පාදු අවධානය යොමු කර ඇත්තේ අයවැය භාෂාවෙන් ගෘහ අභිමත වියදම් ලෙස හැඳින්වෙන හිමිකම් නොපෑහැකි වැඩ සටහන් වෙත ය. ඒ අනුව අවුරුදු 10ක් තුල ඩොලර් ට්‍රිලියන 1.5 සිට 1.7ක කප්පාදුවක් ඇස්තමේන්තු කර ඇත. විශාල කප්පාදුවලට ලක්ව තිබෙන වැඩසටහන් වලට විද්‍යාල සිසුන්ගේ පෙල් නමැති අධ්‍යාපන දීමනාව ආහාර මුද්දර ප්‍රවාහන වියදම් සම්පාදනය හා එක්සත් ජනපද රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ද ඇතුලත් ය.

ඔබාමා නායකත්වය ගන්නා ධවල මන්දිර සාකච්ඡා වෛද්‍ය ආධාර, සෞඛ්‍ය ආරක්ෂන හා සමාජ සුභසාධනය යන සැබවින් ම නිව් ඩීල් වැඩපිලිවෙලින් ස්ථාපිත කල හා 1960 ගනන්වල පුලුල් කල ඉතිරිවී ඇති සමාජ සුබසාධන ව්‍යුහයේ සියලුම දේ වෙත යොමුව ඇත.

සෞඛ්‍ය ආරක්ෂනයඃ ෆෙඩරල් හා ප්‍රාන්ත ආන්ඩුවල ඒකාබද්ධ වැඩ සටහනක් වන මෙය දුප්පත් හා ආබාධිත අයගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා මෙන්ම මහලු දුගී කොටස්වල සාත්තු නිවාස සේවා සඳහා ද ගෙවීම් කරයි. සමාජ ජරපත්වීම හා ආර්ථික අවපාතයේ බලපෑමට අඩුවෙන්ම මුහුනපෑමේ හැකියාව ඇත්තේ සෞඛ්‍ය ආරක්ෂන ප්‍රතිලාභීන්ය යන්න නිර්නායකයකි. එක්කෝ ඔවුන් අන්ධ ය, නැතිනම් මානසිකව හෝ ශාරීරිකව දුබල ය, ඒත් නැත්නම් රැකියාවේදී හෝ මාර්ග අනතුරකින්, වෙනත් ක්‍රමයකින් වැඩ කල නොහැකි තත්වයට පත්ව ඇති බැවින් ඔවුන්ට තමන්ටම කියා මූල්‍ය සම්පත් ඇත්තේ නැත.

ඔබාමා පරිපාලනය ඉදිරි දස වසර තුල සෞඛ්‍ය ආරක්ෂන පිරිවැය ඩොලර් බිලියන 100 කින් කැපීම සඳහා එකඟත්වය පලකොට තිබේ. එය සිදුවන්නේ ලමා සෞඛ්‍ය රක්ෂන වැඩ සටහන කප්පාදු කිරීම ආරෝග්‍යශාලා හා අනෙකුත් සෞඛ්‍ය සේවා සම්පාදකයින් ගෙන් බදු අයකිරීමට රජයට ඇති හැකියාව සීමා කිරීම ද ඇතුලු සෞඛ්‍ය ආරක්ෂනයේ ෆෙඩරල් පිරිවැය කපා හැරීමෙනි.

සෞඛ්‍ය ආරක්ෂනය සඳහා ගෙවීම් කරන්නේ ප්‍රාන්ත ආන්ඩුවල පරිපාලනය යටතේ මධ්‍යම ආන්ඩුව විසින් නිසා එම අංශයේ කප්පාදුවක් ප්‍රාන්ත අයවැය හැකිලීමට තුඩු දෙන අතර එය දැනටමත් ප්‍රාන්ත ආන්ඩු දුසිම් ගනනක පටි තද කිරීම් හා දොට්ට දැමීම් සඳහා දොර විවෘත කර තිබේ. සෞඛ්‍ය ආරක්ෂනයේ කප්පාදුව සමස්තයක් වශයෙන් මිනිසුන් දස ලක්ෂ ගනනකට සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව ක්ෂනිකව අවහිර කරන අතර ඉන් බොහොමයක් ලමුන් වන තත්වය හමුවේ ඊළඟ වසර දහය තුල ලෙඩ රෝග දිගු කලක් රෝහල් ගතවීම හා මරනය වැලැක්විය නොහැකිය.

මහලු අයගේ සෞඛ්‍ය පහසුකම් සඳහා ගෙවීම හෙවත් මෙඩිකෙයා වැඩ සටහන කප්පාදුවේ ලොකුම ඉලක්කය බවට පත්ව තිබේ. කොන්ග්‍රසයේ බහුතර නායක එරික් කැන්ටර්ට අනුව වසර දහයක් තුල මෙඩිකෙයා වැඩසටහනෙන් ඩොලර් බිලියන 353ක් කැපීම පිලිබඳව ඔබාමා පාලනය දැනටමත් සාකච්ඡා පවත්වා ඇත ගෘහ සෞඛ්‍ය ආරක්ෂාව හා විද්‍යාගාර පරීක්ෂන සඳහා හවුල් ගෙවීම් සහ මෙඩිගැප් අතිරේක රක්ෂන සැලස්ම යටතේ සැපයිය හැක්කේ මොන සේවා ද යන්න මත සීමා කිරීම් සලකා බැලෙන යෝජනා අතර වේ.

සමහර වෛද්‍ය රැකවරන ප්‍රතිලාභ පරීක්ෂනයට ලක් කෙරෙනු ඇත. එනම් ඉහල ආදායම් ප්‍රතිලාභීන්ට ඉහල අයකිරීම් ය. මේ මගින් වැඩසටහනේ සාර්වත්‍රික ස්වභාවය යටපත් කිරීමටත් එය දුප්පතුන්ගේ "සුබසාධක" වැඩසටහනක් බවට හැරවීමටත් රිපබ්ලිකානුවන් දීර්ග කාලයක් තිස්සේ බලා සිටි වෙනස ක්‍රියාත්මක වෙයි.

රෝග වැලැක්වීම සෞඛ්‍ය අධ්‍යාපනය හා මහජන සෞඛ්‍ය වැඩසටහන් සඳහා වියදම් කපා හැරෙනු ඇත. වියදම් දැරිය නොහැකි දුප්පත් රෝගීන්ට ප්‍රතිකාර කිරීම මගින් බොල් නය ගොඩගැසී ඇති රෝහල්වල ප්‍රතිපූරන ද කප්පාදුවට අයත්ය.

පසුගිය බදාදා ඔබාමා අනුමත කල බව වාර්තාවූ බරපතල ම ප්‍රහාරය නම් යෝග්‍යතා වයස අවුරුදු 65 සිට 67 දක්වා ඉහල දැමීමයි. අවුරුදු 65න් පසුව ජීවිත අපේක්ෂාව තව අවුරුදු 17ක් ලෙස සැලකුවහොත් අවුරුදු දෙකක යෝග්‍යතා කප්පාදුව වෛද්‍ය රක්ෂනය ලබන ඊළඟ පරම්පරාවේ එනම් 1970ට පසු ඉපදුන අයගේ ජීවිත අපේක්ෂාවේ ප්‍රතිලාභවලින් සියයට 12ක කැපීමකි.

සෞඛ්‍ය ආරක්ෂනයේ කප්පාදුව අතිවිශාල මානව ව්‍යසනයක් වනු ඇත. වැඩිහිටි ජනයාට නැවත වතාවක් කෑම හා බෙහෙත් තුන්ඩුවක් ගැනීම අතරින් හෝ ගෙවල් කුලී ගෙවීම හා වෛද්‍ය බිල් ගෙවීම අතරින් එකක් තෝරා ගැනීමට බල කෙරෙනු ඇත.

සමාජ සුරක්ෂිතතාවඃ වැඩිහිටියන්ගෙන් තුනෙන් දෙකක් සිය ආදායමේ වැඩි පංගුවක් ආන්ඩුවේ විශ්‍රාම වැටුප් මඟින් පියවා ගනී. තුනෙන් එකකගේ ආදායමෙන් සියයට 90ක් හෝ ඊට වැඩි ප්‍රමානයක් සමාජ සුරක්ෂිත වැඩසටහනෙන් ආවරනය වේ. 2009දී සමාජ සුරක්ෂිතය මිලියන 14ක ජන සංඛ්‍යාවක් දුගී බවේ රේඛාවෙන් ඉහල තැබී ය. කාන්තා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට අනුව සමාජ සුරක්ෂිතතාව නොමති වුවහොත් අවුරුදු 75 හෝ ඊට වැඩි කාන්තාවන්ගෙන් සියයට 58ක් ද පිරිමින් සියයට 48ක් ද දරිද්‍රතාවයට ඇද වැටෙනු ඇත. ඔබාමා සමාජ සුරක්ෂිත වැඩසටහන කප්පාදු කිරීමේ සාකච්ඡාවල මූලිකත්වය ගත්තේ ය. මෙම පියවර 2005දී සමාජ සංරක්ෂනය පුද්ගලීකරනය කිරීමට උත්සාහ කල ජෝර්ජ් බුෂ්ගේ ඇදවැටීම තවමත් මතකයෙහි ඇති නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ උග්‍ර දකෂිනාංශික කන්ඩායමේ ඉල්ලීම් ද ඉක්මවා ගියේ ය.

සමාජ සුරක්ෂිතය පිලිබඳ මූලික යෝජනාව නම් චේන්ඩ් සීපීඅයි යන ගනිතමය සූත්‍රය යොදා ගනිමින් ප්‍රතිලාභ ගනනය කිරීමයි. ඉහත කී ක්‍රමය වැඩිහිටියන්ගේ වෛද්‍ය ඖෂධ උපකරන හා සේවාවන් සඳහා වන වියදම්වලින් වැඩි කොටස ගනන් නොගන්නා උද්ධමනය පිලිබඳ ව්‍යාජ ඇසතමේන්තු යොදාගනිමින් අනාගත ප්‍රතිලාභ වැඩිකිරීම් තියුනු ලෙස කපාහරින ගිනුම් සූත්‍රයකි.

*ලොස් ඇන්ජලිස් ටයිම්ස් තීරු රචක මයිකල් හිල්ට්ශික්ට* අනුව "අයවැය කප්පාදු කරුවන්ට චේන්ඩ් සීපීඅයි මන්ත්‍රයේ වාසිය නම් එය වසරකට සියයට දශම 2ක් 3ක් බැගින් සම්ප්‍රදායානුකූල සීපීඅයි ක්‍රමයට වඩා පහල අනුපාතයකින් නිරන්තරව ඉහල යෑම යි. චේන්ඩ් සීපීඅයි ක්‍රමයට ජීවන වියදම් වැඩිවීම් ගනන් බැලීම වර්තමාන සූත්‍රය හා සැසඳූ විට ඕනෑ ම අවුරුදු 30ක දී වැඩිහිටියෙකුගේ ප්‍රතිලාභ ආසන්න වශයෙන් සියයට 10ට වඩා කැපීමක් යයි සමාජ සුරක්ෂිතයේ විශේෂඥයින්ම ගනන් බලා ඇත.

වෙනස් කරන ලද සීපීඅයි ගනන්බැලීම්වල බලපෑම ප්‍රතිග්‍රාහකයන්ගේ වයස හා සම්බන්ධ වේ.

"දිගු කලක් ප්‍රතිලාභ ලබන තාක් දුරට ඔබ සිටිනුයේ සිටිය යුතු තැනට වඩා පසුපසිනි. අවුරුදු 85ක් වයසැති අයෙකුගේ පුතිලාභ මට්ටම ඩොලර් 1,000 ක කැපීමක් විය හැක. අවුරුදු 95දී කැපීම ඩොලර් 1,400ක් විය හැක ඉදිරි අවරුදු 10දී චේන්ඩ් සීපීඅයි ක්‍රමය සමාජ සංරක්ෂන ප්‍රතිලාභ ඩොලර් බිලියන 112කින් කප්පාදු කරනු ඇත. මෙම සංඛ්‍යාව ඊලඟ දශකවල දී සීඝ්‍රයෙන් වැඩිවෙනු ඇත එම ඉතිරිකිරීම් වලින් තුනෙන් දෙකක් වසරකට ඩොලර් 100,000ට අඩුවෙන් උපයන්නන්ගෙන් වනු ඇතැ යි" ඒකාබද්ධ බදු කමිටුව ඇස්තමේන්තු කරයි.

මෙම කරුනු හා ගනන්හිලව් ඔබාමා පරිපාලනය හඹායන ප්‍රතිපත්තියේ පන්ති අක්ෂය විදහා දක්වයි. ධවල මන්දිරයේ ප්‍රජාතන්ත්‍රවාදියෝ ඇමෙරිකානු සමාජයේ ඉතාමත් අනාරක්ෂිත දශ ලක්ෂ සඛ්‍යාවකගේ ජීවිත හා ජීවන තත්වයන් විනාශ කිරිමට වෝල් වීදියේ ආඥාවන් ක්‍රියාවට දමති.

මෙය හුදෙක් ඔබාමා රිපබ්ලිකානු දක්ෂිනාංශයේ පීඩනයට යටත්වීම නිසා සිදුවන්නක් නොවේ. සමස්තයක් ලෙස ඩිමොක්‍රටික් පක්ෂය ද විශේෂයෙන් ම ඔබාමා ද හිමිකම් වැඩසටහන්වලට පහර දීම මූල්‍ය ප්‍රභූවගේ පන්ති අවශ්‍යතාවයන් ආරක්ෂා කිරීමේ හදිසි අවශ්‍යතාවයක් ලෙස දකී. හරියට ම ග්‍රීසියේ, පෘතුගාලයේ, අයර්ලන්තයේ හා ලෝකය පුරා ඔවුන්ගේ සගයින් මෙනි.

ඔබාමා පරිපාලනයේ ආධාරකරුවන්ට පවා මෙම දේශපාලන යථාර්ථය පිලිගැනීමට බල කෙරී ඇත. ලිබරල් තීරු රචක හැරල්ඩ් මේයර්සෝන් මේ සතියේ මෙසේ ලීවේ ය. "ජනාධිපති ඔබාමා බොහෝ දුරට දකුනට තල්ලූ වී ඇත. රිපබ්ලිකානුවන් විසින් ඉවත දමන ලද බොහෝ පරමාදර්ශයන් ඔහු ඇහිඳ ගෙන ඒවා තමන්ගේ ම දේ ලෙස වැලඳගෙන ඇත. ඔබාමායි දැන් හිඟ හා නය ගසා කන්නා. ඔහු සමාජ සුරක්ෂිතය හා වෛද්‍ය ආධාර කප්පාදු යෝජනා කර ඇත."

ඩිමොක්‍රටික් හා රිපබ්ලිකානු දේශපාලඥයින් හා ව්‍යාපාර පාලිත ජන මාධ්‍ය විසින් ඉදිරිපත් කරන්නක් බැවින් අයවැය විවාදයේ සම්පූර්න රාමුව ම ප්‍රතික්ෂේප කරන ලෙස සමාජවාදී සමානතා පක්ෂය වැඩ කරන ජනතාවගෙන් ඉල්ලයි. ඇමෙරිකානු ධනවාදය විසින් ඇති කරන ලද ආර්ථික හා මූල්‍ය අර්බුදය සදහා ගෙවීමට වෛද්‍ය ආධාර සෞඛ්‍ය රක්ෂන සමාජ සුරක්ෂිතය හෝ අනෙක් ඕනෑ ම වැදගත් සමාජ වැඩසටහන්වලින් හෝ එක ඩොලරයක් එක සතයක් නොකැපිය යුතු යයි අපි කියමු.

වැඩ කරන ජනතාව වැඩිහිටියන්, දුප්පතුන්, ආබාධිතයින් හා ලමුන් මෙම අර්බුදය ඇති කලේ නැත. එබැවින් ඔවුහු එයට ගෙවන්නන් නොකල යුත්තෝ ය. ආන්ඩුවේ හිඟයන් මකා දැමීමට හා අධ්‍යාපනය සෞඛ්‍ය සේවා මහජන ප්‍රවාහනය හා සමාජ පොදුකාර්ය ඇතුලත් රජයේ සේවය විශාල ලෙස පලල් කිරීමට හා වැඩිදියුනු කිරීමට අවශ්‍ය සම්පත් - ධනය නැවත බෙදාහැරීම මගින් හා ලාභය සදහා නොව මානව අවශ්‍යතාවන්ට සේවය කිරීම සදහා ආර්ථික පැවත් ම ප්‍රතිසංවිධානය කිරීම තුලින් ලබා ගත යුතු ය.

පසුගිය තිස් වසර පුරා එක්සත් ජනපද පාලක ප්‍රභූව පහල සිට ඉහලට මානව ඉතිහාසයේ දැවන්ත ම ධනය ගලායාම හසුරුවා ඇත. ධනවත් ම සියයට එක ජාතික ආදායමේ ඔවුන්ගේ කොටස තුන්ගුනයකින් වැඩි කර ගනිමින් ජාතික ධනයෙන් සියයට 40කට වඩා පොදිගසාගෙන ඇත. අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා මුදල් නැත යන නිගමනය මත පාදක නිල අයවැය සාකච්ඡා සමාජයේ මෙම සම්පත් බෙදීයාම ස්ථිර හා වෙනස් කල නොහැකි දෙයක් ලෙස සලකයි.

සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්තිය මුහුන දෙන අර්බුදය විසදීම සදහා හදිසි පියවර මාලාවක් යෝජනා කරයි. අපි ඉරාකයෙන්, ඇෆ්ගනිස්ථානයෙන් හා අනෙකුත් සියලූ ම රටවලින් ඇමරිකානු හමුදා ඉවත් කිරිමටත්. මහජනතාවගේ අවශ්‍යතාවන් ඉටුකිරීමට ෆෙඩරල් සම්පත් මිලිටරිය වෙතින් යලි හරවා ගැනීමටත් සටන් කරමු. ඩොලර් 500,000 වඩා වැඩි සියලූම ආදායම් ලාභීන්ගෙන් සියයට 90ක බදු ද කෝටිපතියන්ගේ හා ප්‍රකෝටිපතියන්ගේ වත්කම්වලින් ඒ ආකාරයේ ම ධන බද්දක් ද අපි යෝජනා කරමු.

අර්බුදය සඳහා කම්කරු පන්තියට ඇති එක ම විසඳුම වනුයේ ශ්‍රමය විසින් නිර්මානය කෙරුනු පාලක ප්‍රභූවගේ දේපල අහෝසි කිරීමට සහ ප්‍රධාන බැංකු හා ව්‍යාපාර පෞද්ගලික ලාභය නොව, පොදුවේ භාන්ඩ නිෂ්පාදනය කරන මහජන ව්‍යවසායන් බවට පරිවර්තනය කිරීමට ස්වාධීන ජනතා දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම යි. මෙය යි සමාජවාදය සඳහා සටන!

**පැට්‍රික් මාටින්**

© www.wsws.org



.